# තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
## අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

TVEC

# පුරප්පාඩු

1990 අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත මඟින් පිහිටුවන ලද 1999 අංක 50 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන (සංශෝධිත) පනත මඟින් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් බවට පත් කරන ලද තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව, වෘත්තීය හා කාර්මික අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති, සැලසුම් ක්‍රියාත්මක කිරීම, ප්‍රමිතිකරණය සහ සහතික කිරීම් යනාදී කාර්යයන් ඉටුකිරීමේ ජාතික නියාමන ආයතනය වේ. මෙම කොමිෂන් සභාවේ පහත සඳහන් තනතුරු සඳහා මතු දැක්වෙන සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම තනතුරු සඳහා තෝරා ගන්නා නිළධාරීන් කොමිෂන් සභාවේ ඕනෑම අංශයක /දිවයිනේ ඕනෑම ස්ථානයක සේවය කිරීමට හැකියාව තිබිය යුතුය.

## 1. රියදුරු (PL 3) - තනතුරු සංඛ්‍යාව - 05

**සුදුසුකම් හා පළපුරුද්ද**

**අධ්‍යාපන**

අ.පො.ස. (සා.පෙළ) සිංහල, ගණිතය ඇතුළුව විෂයන් හයකින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත් වී තිබීම.

**ශිල්පීය නිපුණතා / ප්‍රවීනතා**

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ වලංගු කාලය සහිත සියළුම බර වාහන පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම සහ රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු අවම වශයෙන් වසර තුන (03) ක පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

සහ

මෝටර් රථ කාර්මික විෂය පිළිබඳ සාමාන්‍ය දැනුම, මනා ඇස් පෙනීම සහ අවම ශාරීරික උස අඩි 5 යි අඟල් 2 ක් තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

ඉහත දැක්වෙන පරිදි රියදුරු බලපත්‍රය හා පලපුරුද්ද සහිත ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයන්හි සේවකයින්.

**වැටුප් පරිමාණය**

රු.43,280-10 × 490 - 10 × 540 - 10 × 590- 12 × 630 - රු.67,040
(කළමනාකරණ සේවා අංක 01/2025 දරණ චක්‍රලේඛයට අනුකූලව මෙම වැටුප අදාළ වන්නේ 2027.01.01 දින සිටය. 2026.01.01 දිනට ගෙවන වැටුප රු.40,834).

**වයස**

වයස අවුරුදු 18 ට වැඩි අවුරුදු 45 ට අඩු විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙම උපරිම වයස් සීමාව අදාළ නොවේ).

**බඳවාගන්නා ක්‍රමය**

ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම මඟින් අයදුම්පත් කැඳවීමෙන් පසුව ඒ ඒ තනතුරට අදාළ වන පරිදි වූ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක හා වෘත්තීය ප්‍රවීණතා තහවුරු කර ගැනීමේ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනේ.

## 2. කාර්යාල සහායක තනතුර (PL -1)- තනතුරු සංඛ්‍යාව - 02

**සුදුසුකම් (බාහිර අයදුම්කරුවන් සඳහා)**

**අධ්‍යාපන**

අ.පො.ස. (සා.පෙළ) භාෂාව හා ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයයන් හයකින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත් වී සිටිය යුතුය.

**වැටුප් පරිමාණය**

රු. 40,500 - 450 x 10 - 490 x 10 - 540 x 7- 590 x 15 - රු. 62,530
(කළමනාකරණ සේවා අංක 01/2025 දරණ චක්‍රලේඛයට අනුකූලව මෙම වැටුප අදාළ වන්නේ 2027.01.01 දින සිටය. 2026.01.01 දිනට ගෙවන වැටුප රු.38,488)

**වයස**

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

**බඳවාගන්නා ක්‍රමය**

ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම මඟින් අයදුම්පත් කැඳවීමෙන් පසුව පත්වීම් බලධාරියා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් තෝරා පත්කරගැනේ.

**වෙනත්**

සෑම අපේක්ෂකයෙක්ම,
ආ. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ඇ. තනතුරට පැවරෙන කාර්යයන් මනාව ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
ඇ. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

**පොදු කරුණු**

අ. සේවක අර්ථසාධක අරමුදල සඳහා ඔබගේ වැටුපෙන් 8% ගෙවිය යුතු අතර, මෙම කොමිෂන් සභාව විසින් ඔබගේ වැටුපෙන් 12% සමාන මුදලක් හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට 3% ට සමාන මුදලක් ගෙවනු ලැබේ.
ආ. ඉහත මූලික වැටුපට අමතරව රජයේ අනුමත වෙනත් දීමනා හිමිවේ.
ඇ. මෙම තනතුර ස්ථිර වන අතර, පරිවාස කාලයකට යටත් වේ.
ඈ. බඳවා ගැනීමේ පටිපාටි සංශෝධනයේ දී ඇති විය හැකි සංශෝධනයන්ට යටත් විය යුතුය.
ඉ. අයදුම්පත් යොමු කිරීමේදී ඉදිරිපත් කරනු ලබන සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත් අයදුම්පත් සමඟ ඉදිරිපත් කළ යුතුය.

www.tvec.gov.lk වෙබ් පිටුවේ පළකර ඇති ආකෘතිය අනුව තමන් විසින් සකස් කරන ලද අයදුම්පත්‍රය සමග සහතික කරන ලද සහතිකපත් වල පිටපත් සහ අදාළ ලේඛන 2026.10.15 වන දිනට හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට එවිය යුතුය. දැනටමත් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් තම අයදුම්පත්‍රය ආයතන ප්‍රධානීන් මඟින් යොමු කළ යුතු වන අතර, සේවයෙන් නිදහස් කිරීමට එකඟ වන්නේද යන්න පැහැදිලි ලෙස සඳහන් කළ යුතුය. ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. අපැහැදිලි අසම්පූර්ණ හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.


| | |
|---|---|
| දුරකථන | : 011 760 8000 |
| ෆැක්ස් | : 011 255 5007 |
| විද්‍යුත් තැපෑල | : info@tvec.gov.lk |
| වෙබ් | : www.tvec.gov.lk |

අධ්‍යක්ෂ ජනරාල්,
තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව,
"නිපුණතා පියස", 03 වන මහල,
354/2, ඇල්විටිගල මාවත,
කොළඹ 05.